**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**

**10 ශ්‍රේණිය**

**ඉතිහාසය - I කොටස**

**I වාර පරීක්ෂණය - 2013** පැය 2

නම/විභාග අංකය: ..................................................................................................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන දැනුම භාවිතා කළ යුතු ආකාරය වඩාත් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය මින් කුමක්ද?
   (i) අතීතයේ කළ වැරදි නැවත ඇති නොවීමට වගබලා ගැනීම
   (ii) අතීත ශ්‍රී විභූතිය පිළිබඳ අභිමානයක් ඇතිකර ගැනීම
   (iii) අතීතයේ දී ලත් ජයග්‍රහණ අනාගතයේදී ද ලබා ගැනීම
   (iv) අතීතය තුළින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නගා ගැනීම

2. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය කෘතියේ ශ්‍රී ලංකාව හඳුන්වා තිබෙන නම් දෙකක් වනුයේ පහත පිළිතුරු අතරින් කවරක් ද?
   (i) සෙරන්ඩිබ් හා සිලෝන් (ii) තම්බපණ්ණි හා ලංකාද්වීපය
   (iii) ටැප්‍රොබේන් හා සෙරන්ඩිබ් (iv) තාම්‍රපර්ණි හා පාරසමුද්‍ර


3. පහත රජවරු මගධයේ බලයට පත් වූ අනුපිළිවෙල අනුව පෙළ ගැස් වූ විට නිවැරදි ලිළිතුර වන්නේ,
   A - අජාසත්ත B - චන්ද්‍රගුප්ත C - බිම්බිසාර D - බිංදුසාර

   (i) ABCD (ii) CDBA (iii) CABD (iv) CADB

4. පළාත් පාලනය රජ පවුලේ කුමාරවරු හෝ අමාත්‍යවරු විසින් සිදුකළ පාලන යුගය වනුයේ,
   (i) ගුප්ත යුගය (ii) වෛදික යුගය
   (iii) මෞර්ය යුගය (iv) පශ්චාත් වෛදික යුගය

5. ඉන්දියාවෙන් බැහැරට ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත කළ රජු වනුයේ,
   (i) I චන්ද්‍රගුප්ත (ii) II චන්ද්‍රගුප්ත (iii) සමුද්‍ර ගුප්ත (iv) ස්කන්ධ ගුප්ත

- **6-10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන සිතියම ඇසුරෙන් සඳහන් කරන්න.**





6. පසුකාලීනව මගධයේ අගනුවර වූ නගරය දැක්වෙන අක්ෂරය .................... ය.
7. සොළොස් මහා ජනපද අතරින් ප්‍රබල ම ජනපදය දැක්වෙන අක්ෂරය ...................... ය.
8. ඉන්දියාවට ආර්යයන් සංක්‍රමණය වූ දුර්ග මාර්ගය දැක්වෙන අක්ෂරය ................ ය.
9. ................. අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශය ජය ගැනීමෙන් පසු අශෝක අධිරාජ්‍යයා දිග් විජය ප්‍රතිපත්තිය අත්හරින ලදී.

10. C අක්ෂරයෙන් දැක්වෙන ගංගාව වන .......................................... ගංගාව ආශ්‍රිතව ආර්යයන් මුලින් ම පදිංචි වූ බව විශ්වාස කෙරේ.

- **සුදුසු පිළිතුරු යොදා පහත ඡේදයේ හිස්තැන් පුරවන්න.**

මධ්‍යම ආසියාවේ (11) ................................. තණබිම් ආශ්‍රිත ප්‍රදේශයේ මුල්ම ආර්යයන්ගේ නිජබිම් පිහිටි බව ඉතිහාසඥයින්ගේ මතයයි. මොවුන්ගෙන් කොටසක් ගොඩබිම් මාර්ගය ඔස්සේ (12) ................................. දෙසටත්, තවත් කොටසක් ඉන්දියාව දෙසටත් සංක්‍රමණය විය. ඔව්හු (13) ................................. රට හෙවත් වර්තමාන (14) ................................. ප්‍රදේශයේ පදිංචි වූ අතර මුලදී එම ප්‍රදේශයේ ගංගා හතක් තිබූ නිසා (15) ................................. ප්‍රදේශය නම් විය. ආර්යයන් ඉන්දියාවට පැමිණි මුල් යුගය (16) ................................. යුගය ලෙසත් ඉන්දියාවේ ව්‍යාප්ත වූ පසු අවදිය (17) ................................. යුගය ලෙසත් හඳුන්වනු ලැබේ. ආර්යයන් (18) ...........................................ලෙස සංවිධානය වී සිටි අතර පසුව ගම් බිහි විය. ගමේ නායකයා (19) ................................. ලෙස හැඳින් වූ අතර (20) ................................. හෙවත් බදු එකතු කිරීම ඔහු විසින් සිදු කරන ලදී.

(ලකුණු 2x20=40)



**සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය**
**10 ශ්‍රේණිය**
**ඉතිහාසය - II කොටස**
**I වාර පරීක්ෂණය - 2013**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(1) පහත දැක්වෙන ස්ථාන හා ගංගා සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

(i) මහාතිත්ථ, කදම්බ නදී, උරුවෙල ග්‍රාම, මහියංගනය ,මහනුවර, ගොඩවාය, ගෝකණ්ණ, මාගම (මහාගාම) (ලකුණු 8)

(ii) සඳකඩපහන බුදු දහම පැමිණීමෙන් පසු ශ්‍රී ලාංකිකයන්ට ලැබුණු අගනා කලා නිර්මාණයකි.

(අ) අනුරාධපුර යුගයේ සඳකඩපහනෙහි දක්නට ලැබෙන සත්ව රූපයක් නම් කරන්න. (ලකුණු 1)

(ආ) සඳකඩ පහන දක්නට ලැබෙන්නේ කුමන ස්ථානයක ද? (ලකුණු 1)

(ඇ) සඳකඩ පහන මධ්‍යයේ නිරූපිත පුෂ්පය කුමක්ද? (ලකුණු 1)

(ඇ) පොළොන්නරු යුගයේදී සඳකඩ පහනෙහි දක්නට නොලැබෙන සත්ව රූපය කුමක්ද? (ලකුණු 1)

(iii) අශෝක අධිරාජ්‍යයා චාරිකාවේ යෙදුණු විවිධ විශේෂ ස්ථානවල ස්ථම්භ පිහිටුවන ලදී.

(අ) අශෝක ස්ථම්භ පිහිටි ස්ථානයක් නම් කරන්න. (ලකුණු 1)

(ආ) අශෝක ස්ථම්භවල දක්නට ලැබෙන සත්ව රූප දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ඇ) මෙම ස්ථම්භවල සඳහන් වන්නේ කුමන කරුණු ද යන්න සඳහන් කරන්න.(ලකුණු 1)

(2) (i) ඉතිහාසය යනු කුමක්ද? යන්න සඳහා විවිධ නිර්වචන ඉදිරිපත් වී තිබෙන අතර පහත සඳහන් නිර්වචන ඉදිරිපත් කළේ කවුරුන් විසින්ද යන්න සඳහන් කරන්න.

(අ) "ඉතිහාසය එක් විෂයක් නොව විෂයන් සියල්ල අන්තර්ගත ගෘහයයි".

(ආ) "වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම්ගත යුතුය. (ලකුණු 2)

(ii) ග්‍රීක ජාතික ලේඛකයින් දෙදෙනෙකු විසින් ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු සඳහන් කරමින් රචිත විදේශීය සාහිත්‍ය කෘති දෙකක් හා පොළොන්නරු යුගයේදී රචිත දේශීය සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(iii) ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(3) (i) දසමහා යෝධයින් පිළිබඳව තොරතුරු දැක්වෙන සෙල්ලිපි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) ලෙන් ලිපි හා ටැම් ලිපි පිහිටි ස්ථාන දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) ඉතිහාස මූලාශ්‍රයක් ලෙස කාසි වැදගත් වීමට හේතු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(4) (i) ආර්ය ජනාවාසවල පැවති වෘත්තීන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) වෛදික යුගය පිලිබඳ තොරතුරු සඳහන් ඉතිහාස මූලාශ්‍ර හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) සොළොස් මහා ජනපදවල පැවති පාලන ක්‍රම පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ලකුණු 5)

(5) (i) මෞර්ය රාජ වංශය බලයට පත්වීමට පෙර මගධය පාලනය කළ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

(ii) මගධය ප්‍රබල රාජ්‍යයක් ලෙස ගොඩනැගීමට මුල්කාලීන පාලකයින් අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) අශෝක අධිරාජ්‍යාගේ ආගමික සේවාවන් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(6) (i) ගුප්ත යුගයට අයත් මුර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) මෙම යුගයේ රචිත සංස්කෘත සාහිත්‍ය කෘති හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) ගුප්ත යුගයේදී දියුණු අධ්‍යාපන ක්‍රම පැවති බව අපි දනිමු. මෙම යුගයේදී පැවති අධ්‍යාපන තත්වය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)